හිතවත් ව්‍යාපාරික බැංකු ගණුදෙනුකරුවනි,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ දැක්වෙන නියමයකට අනුව, අපගේ බැංකුව විසින් මූලික කරුණු අන්තර්ගත ලේඛන (**K**ey **F**act **D**ocuments) මාලාවක් සකස් කර ඇති අතර, අපගේ බැංකුව විසින් සපයන බැංකු පහසුකම්/සේවාවන් ඔබට ගැළපෙන ආකාරයෙන් තෝරාගැනීම පිණිස ඔබට සහාය වීමට එකී ලේඛන මාලාවෙන් අපේක්ෂා කරනු ලැබේ.

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී විසින් සපයන ව්‍යාපාර බැංකුකරණ සේවාව පිළිබඳව සංක්ෂිප්ත විස්තරයක් මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනයෙන් (**KFD**) ඔබ වෙත සපයනු ලැබේ.

කෙසේ වූව ද, මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනවල මතු සඳහන් කාරණාවන්, නෛතික සහ නියාමන වෙනස්කම්වලට සහ අපගේ බැංකුවේ ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටිවල සිදුකරන වෙනස්කම්වලට අනුකූලව ප්‍රතිශෝධනය වීම සිදුවන බව කරුණාවෙන් සලකන්න.

මේ පිළිබඳ වැඩි තොරතුරු ලබාගැනීමට ඔබ අපේක්ෂා කරන්නේ නම්, කරුණාකර www.nationstrust.com වෙබ් අඩවිය වෙත පිවිසීමට හෝ +94(0)114 682 555 දරන දුරකථන අංකයෙන් පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය ඔස්සේ අප බැංකුව ඇමතීමට කාරුණික වන්න.

ගිණුමක්/සේවාවක් සම්බන්ධයෙන් යම් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට ඔබට ඇත්නම්, එම පැමිණිල්ල පිළිබඳ දැන්වීම අඩංගු ලුහුඬු ලිඛිත ප්‍රකාශයක්, අප බැංකුවේ customerservice@nationstrust.com යන විද්‍යුත් තැපෑලට යොමු කිරීමෙන් හෝ අංක [ +94(0)114 711 411] දරන දුරකථනය ඔස්සේ අප අමතා දැනුම්දීමෙන් ඉදිරිපත් කළ හැක.

| ගිණුමේ විස්තරය | බැංකු ගණුදෙනුකරුට අත්වන වාසි | බැංකු ව විසින් පනවන ගාස්තු වර්ග සහ වෙනත් අයකිරීම් | ගිණුමක් විවෘත කිරීමට අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි ව්‍යාපාරික බැංකුකරණය වනාහි ඉහළ මට්ටමේ ව්‍යාපාරික කාර්යසාධනයක් අත්කරගෙන සිටින ව්‍යාපාරික බැංකු ගනුදෙනුකරුවන් වෙත පළමු පෙළේ විසඳුම් සේවාවන් පිළිගැන්වීම පිණිස සකස් කර තිබෙන බැංකු පහසුකමක් වේ. මෙම බැංකු පහසුකමේ අංග / සාමාජිකත්වය තෙවදෑරුම් වන අතර, ඒවා ප්ලැටිනම්, ගෝල්ඩ් සහ සිල්වර් වශයෙන් හඳුන්වනු ලැබේ. | | | | |
| **සිල්වර් සාමාජිකත්වය** | | | | |
| බැංකු ගනුදෙනුකරු හුදු ආරම්භක ව්‍යවසායකයෙකු වුවද නොඑසේ නම් පළපුරුදු ව්‍යාපාරිකයෙකු ද, ඔවුන්ගේ යම් ඕනෑම මූල්‍යමය දුෂ්කරතාවන් සමනය කිරීමට විසඳුම් සේවා අප බැංකුව සතුවේ. | සේවා ප්‍රතිලාභ<br>- පැය 24 පුරා ක්‍රියාත්මක සේවයට කැපවුණු ක්ෂණික දුරකථන සේවා පහසුකම<br><br>ගෙවීම් ප්‍රතිග්‍රහණය<br>- FriMi සේවාව, ඇමරිකන් එක්ස්ප්‍රස් අන්තර්ජාල පිවිසුම් සේවාව (IPG) සහ POS සේවාව හරහා ගෙවීම් ප්‍රතිග්‍රහණ පහසුකම<br><br>ඩිජිටල් බැංකු සහන<br>- සම්බන්ධ වීමේ ගාස්තුව NDE පහසුකම මත 50% | හර කිරීමේ දී හෝ බැර කිරීමේ දී, ශ්‍රී ලංකා රුපියල් 25,000/- කට වඩා අඩුවන මාසික සාමාන්‍ය ශේෂය<br><br>- ශ්‍රී ලංකා රුපියල් 2,500/- ක අවම ශේෂයක් පවත්වාගෙන යාමේ ගාස්තුව<br><br>- බැංකු කවුන්ටරයෙන් බැහැරව කරන බැංකු ගනුදෙණු (අරමුදල් මාරුව) වාර සංඛ්‍යාව 25 ඉක්මවන විට, ශ්‍රී ලංකා රුපියල් | - නිසි පරිදි සම්පූර්ණ කරන ලද ව්‍යාපාර ජංගම ගිණුමක් විවෘත කිරීමේ ආකෘති පත්‍රය<br><br>- බැංකුව විසින් තීරණය කරන පරිදි, වලංගු ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය සහ වෙනත් අවශ්‍ය ලේඛන<br><br>ශ්‍රී ලංකා රුපියල් 50,000/- ක ආරම්භක තැන්පතුව<br><br>- ශ්‍රී ලංකා රුපියල් | - ජංගම ගිණුමක දී, මසකට ශ්‍රී ලංකා රුපියල් 25,000/-ක සිට ශ්‍රී ලංකා රුපියල් 499,999/-ක අතර සාමාන්‍ය බැර ශේෂයක් පවත්වාගෙන යාම **හෝ**<br><br>- ඉතිරි කිරීමේ ගිණුමක දී, මසකට ශ්‍රී ලංකා රුපියල් 1,000/- සිට ශ්‍රී ලංකා රුපියල් 9,999,999/-ක අතර සාමාන්‍ය ශේෂයක් පවත්වාගෙන යාම **හෝ**<br><br>- මසකට ශ්‍රී ලංකා රුපියල් 25,000 /-ක සිට ශ්‍රී ලංකා රුපියල් 9,999,999/-ක අතර සාමාන්‍ය හර ශේෂයක් පවත්වාගෙන |

| | | | | |
|---|---|---|---|---|
| | කින් අඩු කෙරේ.<br><br>- පළමු වසර තුළ ගාස්තු රහිත අන්තර්ජාල බැංකුකරණය / ජංගම බැංකුකරණය / FriMi සේවාව (මෙම සේවාවන් ව්‍යාපාරික බැංකු කටයුතුවල නිරත, තනි පුද්ගල බැංකු ගිණුම් හිමි, තනි පුද්ගල බැංකු ගණුදෙනුකරුවන් සඳහා පමණක් ලබාගත හැකිවනු ඇත.)<br><br>- කෙටි පණිවුඩ (SMS) සංඥා පහසුකම<br><br>ගනුදෙණුමය සහන<br>- අත්පිට මුදල් රැස්කිරීමේ සේවාව | 2,500/- ක ගනුදෙණු ගාස්තුවක් පනවනු ලැබේ.<br><br>හර කිරීමේ දී හෝ බැර කිරීමේ දී, ශ්‍රී ලංකා රුපියල් 25,000/- ක සිට ශ්‍රී ලංකා රුපියල් 499,000/- ක අතර මාසික අවම ශේෂය<br>- බැංකු කවුන්ටරයෙන් බැහැරව කරන බැංකු ගනුදෙණු (අරමුදල් මාරුව) වාර සංඛ්‍යාව 25 ඉක්මවන විට, ශ්‍රී ලංකා රුපියල් 1,000/- ක සේවා ගාස්තුවක් පනවනු ලැබේ.<br><br>පූර්වාසන්න තීරුවේ ‘සේවා ප්‍රතිලාභ’ යටතේ විස්තර කරන ව්‍යාතිරේකයන්ට යටත්ව, බැංකුවේ සාමාන්‍ය ගාස්තු හෝ අයකිරීම් අදාළ කරගනු ලැබේ. | 25,000/- ක අවම මාසික සාමාන්‍ය ශේෂයක් පවත්වාගෙන යාම<br><br>- ව්‍යාපාරික ජංගම / ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කිරීම හරහා බැංකු ගණුදෙනුකරු විසින් සිල්වර් සාමාජිකත්වයක් ලබාගනු ඇත. ගිණුමෙහි හැසිරවීම වත (ව්‍යාපාර ජංගම ගිණුමේ කටයුතු සහ එහි පරිමාණයන් යනාදිය) බැංකු ගණදෙනුකරු ගෝල්ඩ් සහ ප්ලැටිනම් සාමාජික තත්ත්වයට උසස් කරනු ලැබේ. | යාම |

| | | | | |
|---|---|---|---|---|
| **ගෝල්ඩ් සාමාජිකත්වය** | | | | |
| අප බැංකුව සිය බැංකු ගණුදෙනුකරුවන්ගේ මතු දවසේ සිහින සැබෑ කිරීමට පහසුකම් සැලසීමේ ව්‍යාපාරික කටයුතුවල නිරතව සිටින්නෙමු. බැංකු ගණුදෙනුකරුවන්ට ඉදිරි මාවතේ පියමං කිරීමට අවශ්‍ය සියළුම නිවැරදි මෙවලම් අප සතුව ඇත්තෙමු. | සේවා ප්‍රතිලාභ<br>- සේවය උදෙසාම කැපවුණු නිලධාරියෙකුගේ නිබඳ සේවා සම්බන්ධතාව<br><br>ණය පහසුකම්<br>- ආකර්ෂණීය ණය පහසුකම් පැකේජයන් සහිතව ව්‍යාපාර සඳහා අත්තිකාරම්* බැංකුවේ සම්මත ණය ඇගයුමකට සහ අනුමත ණය සහ බැංකු ගිණුම් ප්‍රතිපත්තිවලට යටත්ව<br><br>ගෙවීම් ප්‍රතිග්‍රහණය<br>- FriMi සේවාව, ඇමරිකන් එක්ස්ප්‍රස් අන්තර්ජාල පිවිසුම් සේවාව (IPG) සහ POS සේවාව හරහා ගෙවීම් ප්‍රතිග්‍රහණ පහසුකම<br><br>- IPG සේවාව සඳහා සුවිශේෂ වට්ටම් අනුපාත | - සේවා ගාස්තුවක් අදාළ කරගනු නොලැබේ.<br><br>- පූර්වාසන්න තීරුවේ ‘සේවා ප්‍රතිලාභ’ යටතේ විස්තර කරන ව්‍යාතිරේකයන්ට යටත්ව, බැංකුවේ සාමාන්‍ය ගාස්තු හෝ අයකිරීම් අදාළ කරගනු ලැබේ. | - ඉහත සඳහන් කළ පරිදිය. | - ජංගම ගිණුමක දී, මසකට ශ්‍රී ලංකා රුපියල් 50,000/-ක සිට ශ්‍රී ලංකා රුපියල් 4,999,999/-ක අතර සාමාන්‍ය බැර ශේෂයක් පවත්වාගෙන යාම **හෝ**<br><br>- ඉතිරි කිරීමේ ගිණුමක දී, ශ්‍රී ලංකා රුපියල් 10 මිලියන සිට ශ්‍රී ලංකා රුපියල් 14,999,999/-ක අතර සාමාන්‍ය ශේෂයක් පවත්වාගෙන යාම.<br><br>- මසකට කාරක ප්‍රාග්ධනයක දී, ශ්‍රී ලංකා රුපියල් මිලියන 10 සිට ශ්‍රී ලංකා රුපියල් 19,999,999/-ක අතර සාමාන්‍ය හර ශේෂයක් පවත්වාගෙන යාම. (මාස 12 කට වැඩි කාලසීමාවක් සඳහා වන දිගුකාලීන ණය හැර, හර ශේෂ සඳහා, බැංකු අයිරා , ආයාත මූල්‍යකරණ ණය, කෙටිකාලීන ණය, ඇපුරුම් ණය සලකා |

| | | | | |
|---|---|---|---|---|
| | ඩිජිටල් බැංකු සහන<br>- සම්බන්ධ වීමේ ගාස්තුව NDE පහසුකම මත 75% කින් අත්හැරීම<br><br>- පළමු වසර තුළ ගාස්තු රහිත අන්තර්ජාල බැංකුකරණය / ජංගම බැංකුකරණය / FriMi සේවාව (මෙම සේවාවන් ව්‍යාපාරික බැංකු කටයුතුවල නිරත, තනි පුද්ගල බැංකු ගිණුම් හිමි, තනි පුද්ගල බැංකු ගණුදෙනුකරුව සඳහා පමණක් ලබාගත හැකිවනු ඇත.)<br><br>- පළමු වසර තුළ කෙටි පණිවුඩ (SMS) සංඥා පහසුකම<br><br>ගණුදෙනු සහන<br>- අත්පිට මුදල් රැස්කිරීමේ සේවය<br><br>- චෙක්පත් තැන්පතු | | | බලනු ලැබිය යුතුය.) හෝ<br><br>- ශ්‍රී ලංකා රුපියල් මිලියන 35 ක ආයාත සහ / හෝ නිර්යාත ත්‍රෛමාසික ධාරිතාවක් පවත්වාගෙන යාම |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රතිලාභ කොමිස් මුදල මත අත්හැරීම<br><br>- ගාස්තු රහිත සීමා රහිත සන්නම් කළ චෙක්පත් පොත්<br><br>- සේවා ගාස්තු අත්හැරීම<br><br>- අවම ශේෂය හා ගණුදෙනු<br><br>වෙළඳ සහන (රටෙහි වර්තමානයේ පවතින තත්ත්වය නිසා, මතු සඳහන් සහන, නැවත දැනුම් දෙන තුරු, කිසිදු බැංකු ගණුදෙනුකරුවකුට අදාළ නොවන බව සලකන්න.)<br>- ප්‍රතිග්‍රහණය මත ආයාත ලේඛනමය රැස්කිරීමේ බිල්පත් (DA) - කොමිස් මුදල 0.35%<br><br>- ආයාත ලිපි ණය, ගෙවීම් මත ලේඛනමය රැස්කිරීම (DP) - කොමිස් මුදල 0.25% | | | |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රධාන පෙළේ ව්‍යාපාර සිදුකරන තැනැත්තන් සඳහා වරප්‍රසාද<br>- ණය (පුද්ගලික/නිවාස) සහ ලීසිං පහසුකම් වර්ග මත අනුග්‍රාහාත්මක අනුපාතය<br><br>- MOB පහසුකම සඳහා සපයන සම්බන්ධ වීමේ ගාස්තු මාස 3 ක් පුරා අත්හැරීම සහිතව ශ්‍රී ලංකා රුපියල් 25,000/- කට වැඩි යෝග්‍ය සීමාවන් සඳහා AMEX ප්ලැටිනම් හෝ Master Card World පුද්ගලික ක්‍රෙඩිට් කාඩ්පත් පිළිගන්වනු ලැබීම - ණය ඇගයුමකට යටත්ව පමණි.<br><br>- ගුවන් තොටුපල විවේකාගාර පිවිසුම - විවේකාගාර පිවිසුම Master Card World ක්‍රෙඩිට් කාඩ්පතට අවකාශ සලසයි. භාවිත කිරීම | | | |

| | | | | |
|---|---|---|---|---|
| | වෙනුවෙන් බැංකු ගනුදෙනුකරුගෙන් අයකිරීමක් සිදුකරනු ලැබේ. | | | |
| **ප්ලැටිනම් සාමාජිකත්වය** | | | | |
| සියළු ඉඩප්‍රස්ථාවන්ට සරිලන අපගේ ව්‍යාපාරික බැංකුකරණයේ ප්ලැටිනම් සාමාජිකත්වය වනාහී බැංකු ගණුදෙනුකරුගේ ජීවන රටාව අභිවර්ධනය වන පසුබිමක සුරක්ෂිත කරමින්, ගතවන සෑම හෝරාවකදී ම ඔවුන් වෙත අනගි සේවාවක් සැපයීමට සැදී පැහැදී සිටීමකී. | සේවා ප්‍රතිලාභ<br>- සේවය උදෙසාම කැපවුණු නිලධාරියෙකුගේ නිබඳ සේවා සම්බන්ධතාව<br><br>ණය පහසුකම්<br>- ආකර්ෂණීය ණය පහසුකම් පැකේජයන් සහිතව ව්‍යාපාර සඳහා අත්තිකාරම්* බැංකුවේ සම්මත ණය ඇගයුමකට සහ අනුමත ණය සහ බැංකු ගිණුම් ප්‍රතිපත්තිවලට යටත්ව<br><br>ගෙවීම් ප්‍රතිග්‍රහණය<br>- FriMi සේවාව, ඇමරිකන් එක්ස්ප්‍රස් අන්කර්ජාල පිවිසුම් සේවාව (IPG) සහ POS සේවාව හරහා ගෙවීම් ප්‍රතිග්‍රහණ පහසුකම | - සේවා ගාස්තුවක් අදාළ කරගනු නොලැබේ.<br><br>- පූර්වාසන්න තීරුවේ ‘සේවා ප්‍රතිලාභ’ යටතේ විස්තර කරන NTව්‍යතිරේකයන්ට යටත්ව, බැංකුවේ සාමාන්‍ය ගාස්තු හෝ අයකිරීම් අදාළ කරගනු ලැබේ. | - ඉහත සඳහන් කළ පරිදිය. | - ජංගම ගිණුමක දී, මසකට ශ්‍රී ලංකා රුපියල් මිලියන 5 කට වැඩි සාමාන්‍ය බැර ශේෂයක් පවත්වාගෙන යාම **හෝ**<br><br>- ඉතිරි කිරීමේ ගිණුමක දී, මසකට ශ්‍රී ලංකා රුපියල් මිලියන 15 කට වැඩි සාමාන්‍ය ශේෂයක් පවත්වාගෙන යාම **හෝ**<br><br>- මසකට කාරක ප්‍රාග්ධනයක දී, ශ්‍රී ලංකා රුපියල් මිලියන 20 කට වැඩි සාමාන්‍ය හර ශේෂයක් පවත්වාගෙන යාම. (හර ශේෂය සඳහා, බැංකු අයිරා, ආයාත මූල්‍යකරණ ණය, කෙටි කාලීන ණය, ඇසුරුම් ණය සලකා බලනු ලැබිය යුතුය. මාස 12 කට වැඩි කාලසීමාවක් සඳහා වන දිගුකාලීන ණය බැහැර |

| | | | | |
|---|---|---|---|---|
| | - IPG සේවාව සඳහා සුවිශේෂ වට්ටම් අනුපාත<br><br>ඩිජිටල් බැංකු සහන<br>- සම්බන්ධ වීමේ ගාස්තුව NDE පහසුකම මත 100% කින් අත්හැරීම<br><br>- පළමු වසර තුළ ගාස්තු රහිත අන්තර්ජාල බැංකුකරණය / ජංගම බැංකුකරණය / FriMi සේවාව (මෙම සේවාවන් ව්‍යාපාරික බැංකු කටයුතුවල නිරත, තනි පුද්ගල බැංකු ගිණුම් හිමි, තනි පුද්ගල බැංකු ගණුදෙනුකරුව සඳහා පමණක් ලබාගත හැකිවනු ඇත.)<br><br>- පළමු වසර තුළ කෙටි පණිවුඩ (SMS) පහසුකම<br><br>ගණුදෙනු සහන | | | කරනු ලැබේ.) හෝ<br><br>- ශ්‍රී ලංකා රුපියල් මිලියන 65 ක ආයාත සහ / හෝ නිර්යාත ත්‍රෛමාසික ධාරිතාවක් පවත්වාගෙන යාම |

| | | | | |
|---|---|---|---|---|
| | - අත්පිට මුදල් රැස්කිරීමේ සේවය<br><br>- චෙක්පත් තැන්පතු ප්‍රතිලාභ කොමිස් මුදල මත අත්හැරීම<br><br>- ගාස්තු රහිත සීමා රහිත සන්නම් කළ චෙක්පත් පොත්<br><br>- සේවා ගාස්තු අත්හැරීම -අවම ශේෂය හා ගණුදෙනු<br><br>වෙළඳ සහන (රටෙහි වර්තමානයේ පවතින තත්ත්වය නිසා, මතු සඳහන් සහන, නැවත දැනුම් දෙන තුරු, කිසිදු බැංකු ගණුදෙනුකරුවකුට අදාළ නොවන බව සලකන්න.)<br><br>- ප්‍රතිග්‍රහණය මත ආයාත ලේඛනමය රැස්කිරීමේ බිල්පත් (DA) - කොමිස් මුදල 0.30%<br><br>- ආයාත ලිපි ණය, | | | |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙවීම් මත ලේඛනමය රැස්කිරීම (DP) - කොමිස් මුදල 0.175%<br><br>- TT සහ OTT මත ගෙවීම් සඳහා 10% ක වට්ටම. (කොමිස් මුදල්වල දී, 0.15% ක වට්ටම් අනුපාතයක් අදාළ කරගනු ලැබේ.)<br><br>ප්‍රධාන පෙළේ ව්‍යාපාර සිදුකරන තැනැත්තන් සඳහා වරප්‍රසාද<br>- තැන්පතු (විදේශ ව්‍යවහාර මුදල්, ස්ථාවර තැන්පතු සහ විශේෂ ඉතිරිකිරීම් ඇතුළුව) ණය (පුද්ගලික/නිවාස) සහ ලීසිං පහසුකම් වර්ග මත අනුග්‍රාහාත්මක අනුපාත<br><br>- MOB පහසුකම සඳහා සපයන සම්බන්ධ වීමේ ගාස්තු මාස 3 ක් පුරා අත්හැරීම සහිතව ශ්‍රී ලංකා | | | |

| | | | | |
|---|---|---|---|---|
| | රුපියල් 25,000/- කට වැඩි යෝග්‍ය සීමාවන් සඳහා AMEX එක්ස්ප්ලෝර හෝ Amex ප්ලැටිනම් හෝ Master Card World පුද්ගලික ක්‍රෙඩිට් කාඩ්පත් පිළිගන්වනු ලැබීම - ණය ඇගයුමකට යටත්ව පමණි.<br><br>*එක්ස්ප්ලෝර සඳහා අත්හැරීම් සපයනු නොලැබේ.<br><br>- වියදම් කරන පරිමාව පදනම් කරගෙන කෝපරේට් කාඩ්පත්, ඉන්ධන කාඩ්පත්, සුළු මුදල් කාඩ්පත් සහ ඒබීසී සඳහා අනුග්‍රාහාත්මක අනුපාත<br><br>- ගුවන් තොටුපල විවේකාගාර පිවිසුම - විවේකාගාර පිවිසුම Master Card World හෝ Amex ප්ලැටිනම් / එක්ස්ප්ලෝර කාඩ්පත් | | | |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා ප්‍රමුඛතා අවසර පත්‍රයක් පිරිනමනු ලැබේ. භාවිත කිරීම වෙනුවෙන් බැංකු ගනුදෙනුකරුගෙන් අයකිරීමක් සිදුකරනු ලැබේ. | | | |

අද දවසේ ව්‍යාපාරික ලෝකය විසින් ව්‍යාපාර පෙළ ගැස්වීමේ දී, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී ශ්‍රී ලංකාව තුළ ඉහළම පෙළේ ව්‍යාපාරික ආයතන 15 තුළ ලැයිස්තුගත වේ. "මහජනතාවගේ සහ ව්‍යාපාරික ප්‍රජාවේ ඉලක්ක සහ අභිලාෂයන් තිරසාර මාවතක් ඔස්සේ සාක්ෂාත් කරගැනීම පිණිස මූල්‍ය සේවා සහ තොරතුරු සැපයීම මඟින් මහජනතාවට සහ ව්‍යාපාරික ප්‍රජාවට සහාය වීමේ දැක්මට අනුගත වෙමින්" අප බැංකුව බැංකුකරණය සහ මූල්‍යමය නවෝත්පාදක හඳුන්වාදීම් සහ සේවාවන් සැපයීමේ අනගිභවනීය පරිශ්‍රමය තුළ අනේකවිධ බැංකු ගණුදෙනුකරුවන් මෙන්ම වානිජ සහ සමායතනික අංශ සඳහා පුළුල් පරාසයක් දක්වා ව්‍යාප්ත වන සේවාවක් ඉටුකරමින් සිටියි. ඩිජිටල් බැංකුකරණ තාක්ෂණයේ පෙරමුණේ රැදෙමින් ඩිජිටල් වශයෙන් බලවන්තකරණය කෙරෙහි සවිමත් ලෙස ඉලක්ක කරගනිමින්, වැඩි පැය ගණනක් බැංකුකරණ කටයුතුවල නිරතවීම, දින 365 බැංකු කටයුතු සිදුකිරීම සහ ශ්‍රී ලංකාව තුළ පළමු ඩිජිටල් බැංකුකරණ අත්දැකීම වන FriMri තාක්ෂණයට පිවිසීම වැනි බැංකු ගනුදෙනුකරු කේන්ද්‍රකරගත් බොහෝමයක් නවෝත්පාදක ක්ෂේත්‍රයන්හී නියමුවා බවට පත්වී තිබේ. ප්‍රීමියම වටිනාකම සහ සේවාව සපයමින් සිය බැංකු ගනුදෙනුකරුවන්ට අනර්ඝ තිළිණ සහ පහසුකම් සහ අවස්ථාවන් උදාකර දෙමින් සිටියි. තව ද,නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වනාහී ශ්‍රී ලංකාව තුළ ඇමරිකන් එක්ස්ප්‍රස් කාඩ්පත නිකුත් කරන්නා සහ එහි අයිතිය අත්පත් කරගෙන සිටින බැංකුව බවට පත්වී ඇත. ශාඛා කාර්යාල 96 ක් රට පුරා ක්‍රියාත්මක කරනු ලබන අප බැංකුවට, ස්ථාන127 ක් ආවරණය කරමින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලයයක් සතුවන අතර, මුදල් තැන්පතු සහ ආපසු ගැනීමේ යන්ත්‍ර 48 ක් සහ ලංකා පේ නෙට් ජාලය මත ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 3,700 ක් පවත්වාගෙන යනු ලැබේ.

**වෙළුම - 2022 ජනවාරි.**